සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1294

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

**9 - ශ්‍රේණිය**

## නාට්‍ය හා රංග කලාව

**නම/විභාග අංකය :-** ..................................................................... **කාලය : පැය 01 1/2යි.**

## I කොටස

**❋ 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. සතර අභිනයට අයත් නොවන්නේ,
    1. වාචික 2. ආංගික 3. ආහාර්ය 4. උපාංග

02. නාට්‍ය ඉදිරිපත් කර ඇති ආකාරය හඳුන්වන්නේ,
    1. නාට්‍ය ශෛලිය 2. නාට්‍ය රංගනය 3. නාට්‍ය රචනය 4. නාට්‍ය පසුතලය

03. කදා වළලු නාට්‍ය මුල්වරට රඟ දක්වා ඇත්තේ,
    1. ටවර්හෝල් රඟහලේ දී
    2. ජෝන් ද සිල්වා සමරු රඟහලේ දී
    3. නෙළුම් පොකුණ රඟහලේ දී
    4. බොරැල්ල තරුණ බෞද්ධ සමිති ශාලාවේ දී

04. ස්වතන්ත්‍ර නාට්‍යයකි.
    1. කුවේණි 2. මකරා 3. හුණුවටයේ කතාව 4. මනමාලයෝ

05. සාත්වික අභිනය යනු,
    1. සංවාදයකි.
    2. මුහුණෙන් හැඟීම් පළකිරීමයි.
    3. අංග චලනයයි.
    4. ඉරියව් පෑමයි.

**❋ 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් '✓' ලකුණ ද වැරදි නම් 'X' ලකුණ ද යොදන්න.**

06. 'වෙල්ල වැහුම්' එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන්ගේ නාට්‍යයකි. (   )
07. නරිබෑනා මිශ්‍ර ශෛලියේ නාට්‍යයකි. (   )
08. පසුතල නිර්මාණය ආංගික අභිනයට අයත්වේ. (   )
09. මූලික වශයෙන් අංග රචනය කොටස් තුනකට බෙදේ. (   )
10. 'හුණුවටයේ කතාව' හෙන්රි ජයසේන ශූරීන්ගේ නාට්‍යයකි. (   )

**❋ 11 - 15 දක්වා ප්‍රශ්නවලට අදාළ වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. හරිම බඩු හයක් ............................................................ ගේ නිර්මාණයකි.
12. සිංහල හා ඉංග්‍රීසි වේදිකාවේ දක්ෂ රංග වින්‍යාසකරුවෙකු වන්නේ ............................................ මහතාය.
13. නාට්‍යකරුවෙකුගේ ජීවිතය තේමා කර ගත් නාට්‍යයක් වන්නේ ............................................ නාට්‍යයයි.
14. ............................................................ ළමා නාට්‍යයකි.
15. නාට්‍ය සඳහා මුදල් වැය කරන පුද්ගලයා ............................................................ වේ.

(මහගිරිදඹ, සුගතපාල ද සිල්වා, ජෙරොම් ද සිල්වා, සෙල්ලම් ලෙල්ලම්, අර්ථපති)

✲ **16 - 20 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර හිස්තැනෙහි ලියන්න.**

16. සමාරෝපය ප්‍රධාන කොටස් .................................... කට බෙදේ.

17. මූදු පුත්තු නාට්‍යය .................................... නාට්‍යයේ අනුවර්තනයකි.

18. ''දෙයක් වේ නම් යම් සුදුස්සාටම අයිති විය යුතු'' .................................... නාට්‍යයේ තේමාවයි.

19. නාට්‍යය යනු .................................... කලා මාධ්‍යයකි.

20. .................................... පැලඳීම සාත්වික අභිනයට බාධා පමුණුවයි.

(ලකුණු 20 × 1 = 20)

## II කොටස

✲ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත නාට්‍ය ගීත ඛණ්ඩය ඇසුරින් පිළිතුරු සපයන්න.

''අතට වළලු ද - පයට ගිගිරි ද
ලා ගනී කිඳුරඟන - සොබනා.....''

(i) මෙම ගීතය ඇතුළත් සිංහල නාට්‍යය සහ එහි නිර්මාණකරුවා කවු ද? (ලකුණු 01)

(ii) එම නාට්‍යය සඳහා පදනම් වූ ජාතක කථාව කුමක් ද? (ලකුණු 01)

(iii) එම නාට්‍යකරුවා විසින් නිර්මාණය කළ වෙනත් නාට්‍ය නිර්මාණ දෙකක් ලියන්න. (ලකුණු 01)

(iv) දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමණයට දායක වූ වෙනත් නාට්‍යකරුවන් තිදෙනෙක් නම් කර, ඔවුන් නිර්මාණය කළ නාට්‍ය දෙක බැගින් දක්වන්න. (ලකුණු 04)

(v) ඉහත ගීතය සඳහන් නාට්‍යයේ ඔබ කැමති චරිතයක් සඳහා ඔබ සමාරෝපය වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 03)

02. (i) පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියන්න. (ලකුණු 05)

(ii) ඔබ නරඹා ඇති නාට්‍යයක් සඳහා පසුතලයක් ඇඳ නම් කරන්න. (ලකුණු 05)

03. (i) සතර අභිනයේ කොටස් නම් කර හඳුන්වන්න. (ලකුණු 04)

(ii) නළු නිළියන්ගේ රංගනයට උපකාරී වන බාහිර අභිනය නම් කර එහි කොටස් හඳුන්වන්න. (ලකුණු 06)

04. (i) ''පෙරලුණු ඔරුව හරවමු'' රංග අභ්‍යාසය ඔබ පාසලේ සිදු කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 07)

(ii) එම රංග අභ්‍යාසයෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් දක්වන්න. (ලකුණු 03)

05. (i) ''දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ ඉංග්‍රීසි සහ ද්‍රවිඩ නාට්‍යකරුවෙක් බැගින් නම් කර ඔවුන්ගේ නාට්‍ය දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04)

(ii) වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියා නම් කර, ඔහු නිර්මාණය කළ වීදි නාට්‍ය පහක් ලියන්න. (ලකුණු 06)

06. තොප්පි වෙළෙන්දාගේ කතා පුවත අලුත් ආකාරයකට වෙනස් කර, නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න. (රංග විධාන, සංවාද සහිතව) (ලකුණු 10)